# ටෙඩී



***නිම්සරනි බුද්ධිමා ජයසුන්දර***

***3-B***

***මහ/මහමායා බාලිකා විදුහල***

# ටෙඩී

- කතෘගේ නම - කේ.ඒ.එන්.බුද්ධිමා ජයසුන්දර



- ISBN-978-624-206-992-0



- දිනය- 2023-11-15

*

# <u>පෙරවදන</u>

මහමායා විදු පියසේ වසර තුනක් ගතවෙන මට කතුවරියක් වෙන්නට මම ගෙඩක් වසනාවන්ත වෙමි .

මහනුවර මහමායා බාලිකා විදුහල නැමති අභිමානවත් විදුපියසස තුලින් ලොවක් දිනන දිරිය දියනියන් බිහි කිරිමට මෙම ව්‍යායමය මට මහඟු අස්වැසිල්ලකි .

***

අවුරුදු කාලයක් උදා  වුණා .

අපේ ගෙදර හැමෝම අවුරුදු

උත්සවයට එහා ගමට ගියා .



"අනේ, ලස්සන බලු පැටියෙක් "

කියලා මගේ චූටි අයියා වඩාගෙන

අපි ළඟට ගෙනාවා.



අපි ඌව ගෙදර ගෙනාවා. ඌට ටෙඩී කියලා නමක් දැම්මා. ටෙඩී ටික ටික ලොකු වුණා. ඌ මාත් එක්ක සෙල්ලම් කරනවා .



ටෙඩී දැන් ගොඩක් මහතයි . අම්මා
කීවා ටෙඩී අම්මා කෙනෙක් වෙන්න
යන්නෙ කියලා .



ඔන්න දවසක් මම ඉස්කෝලේ ඇරිලා

ගෙදර යනකොට

ටෙඩීට පැටවු හතර  දෙනෙක්

ඉන්නවා.මට හරි සතුටුයි .



මම එයාලව ගොඩක් ආදරෙන්

බලා ගන්නවා.

මම එයාලත් එක්ක සෙල්ලම්

කරන්න හරි ආසයි.



මමයි  චූටි අයියයි එකතු වෙලා

එයාලාට නම් තිබ්බා.

බ්ලැකි , පින්කි , සුද්දි , බ්‍රවුන්

මම ගොඩක්ම ආසා කෙනා ත්මයි

පින්කි.



ටෙඩී කොහෙදෝ බලාගෙන

එයාගේ පැටවු පේන්න නෑ වගේ



අනේ ....! මෙයලාගෙ සෙල්ලම් බලනකොට මට ගොඩක් ආසා හිතෙනවා. පිනුම් ගහනවා. උම්මා දෙනවා. නගුටෙන් අදිනවා.



අපි හැමෝම සතුන්ට

ආදරය කරන්න ඕනෑ.

කරුණාව දක්වන්න ඕනෑ.

"අත්ත්මමා අපට කිවුවා"



# පසුවදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්ථනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාන හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝදයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමානයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචනා කරන්නට විය ඒ තුළින් සම්පාදනවූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැගීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාන රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මිංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත්කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමි.

මෙයට
සෙනෙවිරත්න මහලේකම්
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ
2023.10.20